RARE

# “පමුණුව ප්‍රදේශයේ පදික වෙළෙඳුන්ගේ ජීවන තත්ත්වය

# පිළිබඳව සමාජ විද්‍යාත්මක අධ්‍යයනය”

නම : ඊ.ඒ.එන්.ධම්මික එදිරිසූරිය

අංකය : SOCI/99/040R

සමාජීය විද්‍යාපති (දෑවරුදු), සමාජ විද්‍යාව පිළිබඳ පර්යේෂණ උපාධියෙහි

අවශ්‍යතාවයක් පූරණය කරනු පිණිස කැලණිය විශ්ව විද්‍යාලයේ,

පශ්චාත් උපාධි අධ්‍යයන පීඨය වෙත ඉදිරිපත් කෙරෙන

පර්යේෂණ නිබන්ධයකි.

ප්‍රවේශ අංකය: 1245
වර්ග අංකය:

නොවැම්බර් 2014

## සාරාංශය

ආර්ථිකයේ විශේෂ සංධිස්ථානයක් වන 1977 දී හඳුන්වා දුන් ආර්ථික ප්‍රතිපත්තිය හේතුවෙන් විශාල සමාජ ආර්ථික පෙරළියකට භාජනය විය. ඒ අනුව කෘෂි අංශය ආර්ථිකයට ලබාදුන් දායකත්වය ක්‍රමයෙන් ශ්‍රම සුක්ෂම ආර්ථික ක්‍රමයකට මාරු වී ඇත.මෙවැනි පසුබිමක් තුළ රටපුරා ශීඝ්‍රයෙන් ඇඟලුම් කර්මාන්තය බිහිවිය. පමුණුව හා මහරගම නගරය ආසන්නයේද පදික වෙළඳාම්කරුවන් බිහිවිය.

වර්තමානය වන විට ශ්‍රී ලංකාවේ දළ දේශීය නිෂ්පාදනය සඳහා මෙන්ම කාර්මික අංශයේ ආනයන සංයුතිය හා දේශීය ඇඟලුම් ක්ෂේත්‍රය සඳහා ද වැඩිම දායකත්වයක් සපයන අංශය බවට පත්ව ඇත්තේ ඇඟලුම් කර්මාන්තයයි. පමුණුව ආශ්‍රිතව බිහි වූ නව ව්‍යාපාරික ප්‍රජාව තුළ ඇති වූ විශේෂීකරණයන් ශ්‍රම වෙළඳපොළට කොතෙක් බලපා ඇද්ද යන්න සොයා බලන ලදි.

මෙහිදී "පදික වෙළඳුන්" හට විශේෂ ස්ථානයක් හිමිවේ. මහා පරිමාණ කර්මාන්ත නිසා අතරු ව්‍යාපාරිකයින් බිහි වුවද පදික වෙළඳාම ආශ්‍රයෙන්ද ව්‍යාපාරිකයින් බිහි විය. එබැවින් ඔවුන්ගේ සිතුම් පැතුම් රටාව, හැසිරීම, ආකල්ප උප සංස්කෘතීන් ආදිය අධ්‍යයනය කෙරිණි.

පමුණුව ආශ්‍රිතව බිහිවූ කර්මාන්ත සමඟ ප්‍රදේශයේ ඇති වූ ශීඝ්‍ර සමාජ, ආර්ථික වෙනස්වීම තුළ ගැටෙන සියලු තාරාතිරමේ පුද්ගලයින් අතර මතභේද ගැටුම්,ගැටළු ආදිය පවතී. ඒවා අධ්‍යයනය කිරීම තුළින් පුද්ගලයින්ගේ සිතුම් පැතුම් රටාවන් වෙනසකට භාජනය කළ හැකිය. එසේ නොවූ විට සමාජ ප්‍රශ්න වලට මුහුණ දීමට සිදුවනු ඇත. එබැවින් සමාජ ප්‍රශ්න සඳහා පිළියම් සෙවීම අත්‍යවශ්‍යය කරුණකි. ඒ අනුව අධ්‍යයන කල්පිතය ලෙස " විවෘත ආර්ථිකයත් සමඟ ඇඟලුම් කර්මාන්ත බිහිවීම තුළ පමුණුව ආශ්‍රිතව පදික වෙළඳාමේ නියුතුවූවන්ගේ පවුල්වල ජීවන තත්ත්වය උසස් වී ඇත."

ප්‍රධාන වශයෙන් ද්විතියික මූලාශ්‍ර හා ප්‍රාථමික දත්ත භාවිතා කළ අතර ප්‍රාථමික දත්තයන් සම්මුඛ සාකච්ඡා පත්‍රයක් මගින් එක්රැස් කරගනු ලැබීය. විධිමත් සමාජ සමීක්ෂණයක් පැවැත්වීම සඳහා මහරගම, පමුණුව ආශ්‍රිතව පදික වෙළඳාමේ නියුතු සාමාජිකයින් 70 දෙනෙකු අහඹු ලෙස තෝරා ගන්නා ලදි. තෝරාගත් පදික වෙළෙඳුන් වෙත ගොස් ඔවුන්ගෙන් කාලය වෙන් කරවාගෙන විධිමත් සම්මුඛ සාකච්ඡාවකට භාජනය කරන ලදී.

" මහරගම පමුණුව ආශ්‍රිතව පදික වෙළඳුන්ගේ ජීවන තත්ත්වය පිළිබඳව සමාජ විද්‍යාත්මක අධ්‍යයනයක් " පිළිබඳව වූ අධ්‍යයනයේදී පහත සඳහන් පරිදි නිගමනයන් ඉදිරිපත් කළ හැකිය. එනම් වෙළඳුන් නව තාක්ෂණය භාවිතයට නැඹුරු කිරීම, ඇඟලුම් අපනයන සඳහා රාජ්‍ය මැදිහත් වීම වැඩිකිරීම,වෙළඳපොළ ප්‍රසාරණය සඳහා කටයුතු කිරීම, රාජ්‍ය හා රාජ්‍ය නොවන ආයතන අතර සම්බන්ධතාවය වර්ධනය කිරීම, ක්ෂුද්‍ර මූල්‍ය කටයුතු සඳහා රාජ්‍ය මැදිහත්වීම, පදික වෙළඳුන්ගේ කටයුතු ඇගයීමට ලක් කිරීම ආදිය යන්නයි.

"ඉඟි පද" - විවෘත ආර්ථිකය, පදික වෙළඳුන්, ආර්ථික වෙනස් වීම, ඇගලුම් අපනයන, රාජ්‍ය මැදිහත් වීම.

Summary

There is a big revolution of the economy due to the open economic policy which had been introduced in 1977. This has affected on the agricultural economy and priority has been given to the labour intensive economic systems such as garment industry. Garment factories have mush roomed all over the Island ,There are (pavement sellers) Hawker around Pamunuwa and Maharagama suburb.

At present garment industry supplies the highest contribution for the GDP of the country. It has been observed that how much specialties of the new business community has affected on the labour market.

There is a special place for the street hawkers even though there are sub businessmen due to the large scale industries, businessman have been created by the street business. it was studied their feelings, behavior , attitudes and the subculture.

There are many problems among the persons in Pamunuwa with social and economic transformation of the area. Feelings can be corrected when they are studied and otherwise there may be many problems. Hence as the study hypothesis, "Life standard of the families of Pamunuwa has been upgraded due to the new industries from the open economy" has been considered.

Mainly secondary source and primary data has been used and interviewers have been used to collect the primary data.Sample of 70 members has been selected randomly for the survey and they were subjected for formal interviews.

Following decisions can be presented with the study of "A social scientific study for the life standard of street hawkers at Maharagama and Pamunuwa suburb"

(a) Motivating the street hawkers for new technology.
(b) Increasing the government intervention or garmentry exportation.
(c) Expansion of the market.
(d) Improving the public private partnership.
(e) Government intervention for micro finance.
(f) Apprication of the street hawkers.

"Key words"- open economy, Hawker, economic transformation, Expansion of the market,

Government intervention